# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 36 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 08/01/2024 පැය 1335

## මාධ්‍ය නිවේදනය

**01. නීති විරෝධි මත්පැන් පෙරීමට උපයෝගි කර ගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය.**

2024.01.07 වන දින උදෑසන කාලයේ ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත ගම්පහ පොලිස් වසමේ ඕපාත ඇළ මාර්ගය අසල වැටලීමක් සිදු කර නීති විරෝධි මත්පැන් පෙරීමට උපයෝගී කර ගන්නා ගෝඩා ලීටර් 1,440 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගම්පහ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වූ සීදුව පාර, කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - සීදුව පොලිස් වසම.**

2024.01.07 වන දින රාත්‍රී කාලයේ සීදුව පොලිස් වසමේ හලාවත කොළඹ මාර්ගයේ අම්බලම්මුල්ල ප්‍රදේශයේදී හලාවත දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ බස් රථයක් ඉදිරියෙන් ගමන් කල පා පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පා පැදියේ ගමන් ගත් දෙදෙනෙකු බරපතල තුවාල ලබා සීදුව රෝහලට ඇතුලත් කිරීමේදී පා පැදිකරු මියගොස් ඇත. තුවාලකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා මීගමුව රෝහලට මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 30 ක් වූ සීදුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. සීදුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.